// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2302/36 - 2022 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා - 2022.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම

**ඉඩම් අත්පත් කරගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය )**

**07 වැනි වගන්තිය යටතේ දැන්වීම**

මගේ යොමු අංකය : BD/PS/LND/4/1/16 – iv.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ
යොමු අංකය : 4-3/7/2020/HW/01.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කරගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

**ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය :**

බදුල්ල දිස්ත්‍රික්කයේ, පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 88 K පස්සර නගරය දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පස්සර නගරය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අනුරේඛන අංක බ 777 හි කැබලි 1 ක් වශයෙන් දැක්වෙන මොරගහවත්ත නැමති ඉඩම් කොටස ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0006 ක් වූ ඉඩමේ,

01**.** **කැබලි අංක** 1 **-** මොරගහවත්ත - ප්‍රමාණය හෙක්ටයාර් 0.0006 ක් (සින්නක්කර - තන්ගවෙල් මරදමුත්තු ).

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 08 වැනි දින පූ.භා. 10.00 ට පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සම්මුඛ විය යුතුයි.

තවද, 2022 නොවැම්බර් මස 01 වැනි දිනට මත්තෙන් ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 02 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**එන්.ජේ.ටී. අනුරාධා,**
ප්‍රාදේශීය ලේකම්,
පස්සර.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින
පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-0192

1A - G 37830 – 11 (2022/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*